302

2? MAY 2009

චක්‍රලේඛ අංකය: 04/2009

මගේ අංකය: ප්‍ර.නො.10/15/2009
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක. 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

2009.05. 26

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර් වරුන් වෙත.

## <u>රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදායම් රැස්කිරිම.</u>

මෙම දෙපාර්තමේන්තුවේ පහත සඳහන් විෂයයන් යටතේ රැස්කරනු ලබන අදායම් ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් නමින් ඇති අංක 7041850 දරණ ගිණුමට තැන්පත් කරන ලෙසට අදාළ පාර්ශවකරුවන්ට උපදෙස් ලබා දෙන මෙන් කරුණාවෙන් ඉල්ලමි. මෙම මුදල් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවීමේ පහසුකම ඇත.

1. ශ්‍රී ලංකා පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවේ දේපළ මිළදී ගැනිමේදී ගෙවිය යුතු 100% පැවරුම් බද්ද.
2. නොතාරිස්වරුන්ගේ දෙවෙනි පිටපත් ප්‍රමාද කිරිම සම්බන්ධයෙන් අයකරනු ලබන සමථ මුදල්.
3. උකස් හා බදු ඔප්පු වෙනුවෙන් අයකරනු ලබන හිඟ සහ දඩ මුදල්
4. බිම්සවිය වැඩ සටහන යටතේ සාධන පත්‍ර ලියාපදිංචි කිරිමේ ගාස්තු හා අයදුම්පත් ගාස්තු.
5. බිම්සවිය වැඩසටහන යටතේ ලියා පදිංචි කිරිම සඳහා බාරගනු ලබන උකස් හා බදු සාධන පත්‍ර සඳහා ගෙවනු ලබන මුද්දර ගාස්තු.

02. මෙම මුදල් ලංකා බැංකුවට ගෙවීමෙන් පසුව ලබාගන්නා බැංකු ලදුපත සමඟ සම්පූර්ණ කරන ලද පොදු 118 දරණ මුදල් බාරදෙන වවුචර් පිටපත් දෙකකින් යුත්තව මෙම කාර්යාලයේ මුදල් අංශය වෙත එවන්න. මෙය ලද පසු නිල කුවිතාන්සියක් මුදල් අංශය මඟින් නිකුත්කරනු ලැබේ. ශ්‍රී ලංකා පුරවැසියන් නොවන තැනැත්තන් ශ්‍රී ලංකාවේ දේපළ මිළදී ගැනිමේදී ගෙවිය යුතු පැවරුම් බද්දට අදාළව බැංකු ලදු පත හා දෙපිට පිටපතකින් යුත් පොදු 118 දරණ මුදල් බාර දෙන වවුචර් සමඟ අදාළ ඔප්පුවේ ඡායා පිටපතක්ද මුදල් අංශය වෙත නොපමාව එවිමට කටයුතු කරන්න. විකුණුම් ඔප්පු, තෑගි ඔප්පු, ඉඩම් හුවමාරු ඔප්පු වෙනුවෙන් අයකරනු ලබන හිඟ සහ දඩ මුදල් ගෙවිය යුත්තේ අදාළ පළාත් අදායම් කොමසාරිස්වරයාගේ ගිණුමට බැරවන සේය.

ඊ.එම්.ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:

1. ප්‍රධාන කාර්යාලයේ සහ මධ්‍යම ලේඛනාගාරයේ සියළුම මාණ්ඩලික නිලධාරින් වෙත. - ඔබ ගේ දැන ගැනිම සඳහා.

2. සියළුම කාලාප හා සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත.
   - ඔබ ගේ දැන ගැනිම සඳහා.